# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1904/44 - 2015 මාර්තු මස 04 වැනි බදාදා - 2015.03.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

LA/2306

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට මහඔය ජල සම්පාදන ක්‍රම අදියර II යටතේ බොරපොල විහාරස්ථාන ඉඩම හරහා ජල නල එලීමට ඉඩම් කොටසක පරවශතාව අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ පරවශතා අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2015 පෙබරවාරි මස 24 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර", නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල,
නාගරික සංවර්ධන ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1074.

### උපලේඛනය

අම්පාර දිස්ත්‍රික්කයේ, මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 136/ඒ/1, බොරපොල ග්‍රාම නිලධාරී වසමේ බොරපොල ගමේ පිහිටි බොරපොල පන්සල්වත්ත නමැති ඉඩම පෙන්නුම් කෙරෙන බලයලත් මිනින්දෝරු ජී. අබේගුණවර්ධන මහතා විසින් පිළියෙල කරන ලද අංක 2014/W1 දරන පිඹුරේ කැබලි අංක 2 ලෙස දැක්වෙන සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 3.92ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම සැලැස්මේ කැබලි අංක 1 ඉඩම ; |
| *නැගෙනහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *දකුණට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස හා මහඔය සිට අම්පාර දෙසට වන මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) ; |
| *බටහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය :* විහාරාධිපති,
ශ්‍රී ශාක්‍යසිංහාරාමය,
බොරපොල,
මහඔය.

03 -581

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ, මහනුවර උතුර - පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ, විලාන - උඩගම සේවා ජලාශයේ ප්‍රවේශ මාර්ගය හා නල මාර්ග එළීම හා නඩත්තු කිරීම සඳහා ඉඩම් කොටසක පරවශතාව අත්කර ගැනීමට අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමේ පරවශතා අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2015 පෙබරවාරි මස 24 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර", නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල,
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1076.

***උපලේඛනය***

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, විලාන - උඩගම, ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, විලාන - උඩගම ගමේ පිහිටි, "හපුගොල්ල වතුයාය " නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 21ක් පමණ වන ඉඩම් කොටස :

*ඉඩමේ නම* : හපුගොල්ල වතුයාය
*ප්‍රමාණය* : පර්චස් 21

*මායිම්*

*උතුරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*නැගෙනහිරට* : අලවතුගොඩ - අංකුඹුර ප්‍රධාන මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) සහ මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*දකුණට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*බටහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය :* 01. සීමාසහිත ඉන්ටර් ඇග්රෝ ලංකා (ජේ. වී. පුද්ගලික),
හපුගොල්ල වත්ත,
විලානගම,
(මහනුවර හරහා).

03 -582

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට ඌව පරණගම ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ ලුණුවත්ත ජල පිරිපහදු ඒකකයක් ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයේ දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2015 පෙබරවාරි මස 24 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර", නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල,
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1080.

**උපලේඛනය**

බදුල්ල දිස්ත්‍රික්කයේ, ඌව පරණගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 41B, ලුණුවත්ත ග්‍රාම නිලධාරී වසමේ ලුණුවත්ත හියුගොලන්ඩ්වත්ත - පට්ටියකුඹුරගම ගමේ පිහිටි හියුගොලන්ඩ්වත්ත - ලුණුවත්ත කොටස නමැති ඉඩමෙන් පර්චස් 40ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | තේ වත්ත ; |
| *නැගෙනහිරට* | : | තේ වත්ත ; |
| *දකුණට* | : | තේ වත්ත ; |
| *බටහිරට* | : | ජල සම්පාදන මණ්ඩලයේ ඉඩම. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය :* ප්‍රධාන විධායක නිලධාරී,
සී. ස. මල්වත්ත වැවිලි සමාගම,
අංක 280, වේල්ල වීදිය,
කොළඹ 12.

03 -583

---

LA/2410

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට යාපනය - කිලිනොච්චිය ප්‍රජාමූල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය යටතේ ඩෙල්ෆ් ජල කුළුණ ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයේ දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2015 පෙබරවාරි මස 24 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර", නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල,
නාගරික සංවර්ධන,ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1096.

උපලේඛනය

යාපනය දිස්ත්‍රික්කයේ, වෙල්ෆ් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක J/4, වෙල්ෆ් මධ්‍යම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ තෙරුක්කඩි වෙල්ෆ් ගමේ පිහිටි සින්නාවන් තෝම්පු නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් පර්චස් 20ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | කුමාරවේලු ධර්මලිංගම් මහතා, අරුල්සීලන් මහතා සහ තවත් අය හිමිකම් කියන ඉඩම ; |
| *නැගෙනහිරට* | : | තෝමස් ඇන්තනිදාස් මහතා සහ තවත් අය හිමිකම් කියන ඉඩම ; |
| *දකුණට* | : | අතුරු මාර්ගය ; |
| *බටහිරට* | : | මාර්ගය. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය :* පී. කරුණාකරන් මහතා,
කොට්ඨාස අංක 10,
තෙරුක්කඩි,
වෙල්ෆ්.

03 -584

---

එල්ඒ/1885

## ශුද්ධි පත්‍රය

1974 අංක. 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය රවුෆ් හකීම් වන මම, 2011.12.06 දිනැති අංක. 1735/9 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ 2A හා 3A පිටුවල අංක 12 - 761 යටතේ පළ කරන ලද නිවේදනයේ උපලේඛනයෙහි "කැබලි අංක. 6හි ප්‍රමාණය හෙක්ටෙයාර් 0.0015ක් " යනුවෙන් සඳහන් වුවත් "එහි ප්‍රමාණය හේකටයාර් 0.0016ක් " වශයෙන් සංශෝධනය කරන ලද බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

රවුෆ් හකීම්,
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2015 පෙබරවාරි මස 24 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර", නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල,
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/946.

03-585

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.